# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2079/77 - 2018 ජූලි මස 13 වැනි සිකුරාදා - 2018.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 6/77(ii)

**1977 අංක 8 දරන උද්ධරණ නීතිය**

3 වගන්තිය යටතේ නියමය

1977 අංක 8 දරන උද්ධරණ නීතියෙහි 3(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, මෙම නියමය මගින් පහත සඳහන් ලෙස, එනම්, අපරාධ නඩු පැවරීමට යටත් පුද්ගලයන් සහ දඬුවම් නියම වූ තැනැත්තන් හුවමාරු කිරීම පාලනය කරනු ලබන සහ හසුරුවනු ලබන ද්විපාර්ශ්වික යාන්ත්‍රණයක් පිහිටුවීම සඳහා සහ අපරාධ වැළැක්වීම සහ එම අපරාධ සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීමෙහි ලා තත් ගිවිසුමේ රාජ්‍ය පාර්ශ්වයන් අතර සහයෝගය වර්ධනය වන අයුරින් යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම ද සඳහා 2008 දෙසැම්බර් මස 02 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ විදේශීය රාජ්‍යයක් වන තුර්කි ජනරජය අතර අන්කාරාහි දී උද්ධරණ ගිවිසුමක් අත්සන් කළ බැවින් ද, එක් රාජ්‍ය පාර්ශ්වයක් අනෙක් රාජ්‍ය පාර්ශ්වයෙන් ඉල්ලීමක් කරන ලද විට හා ගිවිසුමේ වගන්තිවලට යටත්ව දඬුවම් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අදාළ පාර්ශ්වයන්ගේ දේශසීමා තුළ දී සොයාගන්නා ලද අපරාධ නඩු පැවරීමට යටත් පුද්ගලයන් සහ දඬුවම් නියම වූ තැනැත්තන්, අනෙක් පාර්ශ්ව වෙත උද්ධරණය කිරීමට බැඳී සිටින බැවින් ද, ඉහත කී ගිවිසුමේ වගන්ති 1977 අංක 8 දරන උද්ධරණ නීතියේ 4 වන වගන්තිය සමග අනුකූල වන බැවින් ද එකී ගිවිසුමේ සඳහන් යම් සංශෝධනයකට, සීමා කිරීමකට හෝ කොන්දේසියකට යටත්ව එකී 1977 අංක 8 දරන නීතියෙහි වගන්තීන් එකී විදේශීය රාජ්‍යය කෙරෙහි අදාළ වන බව ප්‍රකාශ කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපතිවරයා.

2018 ජූනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

07 - 959

1A - PG 4124 — 437 (2018/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*